# ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

# මාර්ග සංවර්ධන අධිකාරිය

# මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 03 වන කොටස

## (පොතුහැර සිට ගලගෙදර දක්වා)

# දේශීය පුද්ගලික උපදේශක තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 3 වන කොටසෙහි පොතුහැර [Chainage 0+000 Km] සිට ගලගෙදර [Chainage 32+450 Km] දක්වා) ඉදිකිරීම් අධීක්ෂණ/කොන්ත්‍රාත් පරිපාලන කටයුතුවල නිරත තම කණ්ඩායම ශක්තිමත් කිරීම සඳහා, පහත සඳහන් තනතුර වෙනුවෙන් පළපුරුදු සහ සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුද්ගලයින් බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සංඛ්‍යාව | උපරිම වයස් සීමාව (අවුරුදු) |
|---|---|---|---|
| 1 | කණ්ඩායම් නායක (Team Leader) | 01 | 75 |

පළපුරුදු සහ සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් මේ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍ර, එක් එක් තනතුරට අදාළ සුදුසුකම්/පළපුරුදු අවශ්‍යතා ඇතුළත් යොමු අනුදේශයන් (TOR) සහ කොන්ත්‍රාත් කොන්දේසි, 2026.07.03 දින සිට 2026.07.14 දින දක්වා වැඩකරන දිනවලදී ව්‍යාපෘති අධ්‍යක්ෂ, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 3 වන කොටස, 3 වන මහල, සෙත්සිරිපාය 1 වන අදියර, බත්තරමුල්ල යන ලිපිනයෙන් ලිඛිත ඉල්ලීමක් මගින් හෝ www.rda.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගැනීමෙන් නොමිලේ ලබාගත හැක.

උපදේශකයන් තෝරාගනු ලබන්නේ ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද සහ කාර්යසාධනය පදනම් කරගෙන වේ. වේතනය සාකච්ඡා කරගත හැකි අතර, කොන්ත්‍රාත්තුව පැවරුම් පදනමක් මත මුලින්ම 2026 වසරේ 3 වන කාර්තුව තුළ ආරම්භ වන පරිදි දින 365 ක කාලසීමාවක් සඳහා වන අතර, උපදේශකවරයාගේ කාර්යසාධනය මත පදනම්ව අවශ්‍යතාවය පරිදි එය දීර්ඝ කළ හැක.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත/පත් සමග සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව සහ පළපුරුද්ද හා සුදුසුකම් සනාථ කරන අදාළ ලේඛනවල පිටපත්, ප්‍රසම්පාදන විශේෂඥ, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, 7 වන මහල, **"මඟනැඟුම මහමැදුර"**, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනය වෙත **2026.07.15** දින **පස්වරු 2.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය නැතහොත් අතින් ගෙනවිත් භාරදිය යුතුය. මෙලෙස ඉදිරිපත් කරන ලද යෝජනා **2026.07.15** දින **පස්වරු 2.15** ට එම භාරදෙන ස්ථානයේදීම විවෘත කරනු ලැබේ.

කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

වැඩිදුර තොරතුරු මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 3 වන කොටසෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයෙන් **011 2877708** සහ **011 2862801** යන දුරකථන අංක මගින් ලබාගත හැක.

**සභාපති**
**අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව**
**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**
**"මඟනැඟුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව පාර, බත්තරමුල්ල.**